# රඹුකන සිද්ධාර්ථ හිමියන්ගේ ගීත නිර්මාණ පිළිබඳ නිදර්ශනාත්මක අසම්පූර්ණ විග්‍රහයක්

—පාතේගම ඥාණිස්සර හිමි
බී. ඒ. (ශ්‍රී ජයවර්ධනපුර) - එම්. ඒ. (කැලණිය)
- එම් ෆිල් (කැළණිය), අධ්‍යාපන ඩිප්ලෝමා (කොළඹ) ,
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය , අනුරාධපුර භික්ෂු සරසවිය.

## 1.1 ගීතය හා ධර්ම සන්නිවේදනය

ධර්ම සන්නිවේදනයෙහිලා සංයම සුශික්ෂිත වපසරියක සිට නූතන ගීත සාහිත්‍යයේ භික්ෂුවගේ ප්‍රවේශය අර්ථකාමී සජ්ජන සුභාවිත කාර්යයක් සේ සැලකීම වටී. විනයෙන් ලද ශික්ෂණය ද සූත්‍ර පිටකයෙන් ලද විද්‍යාව ද පෙරදැරි කරගෙන ගීත සාහිත්‍යය වඩාත් සුභාවිත කිරීමේ මහඟු කාර්යයේ කර උර දී සිටින භික්ෂූන් වහන්සේ අතලොස්සක් පමණවත් සිටීම ගීත සාහිත්‍යකාමී සජ්ජනයන්ගේ අතිශය මනසානන්දයට හේතු භූත වී ඇත. ත්‍රිපිටක සාහිත්‍යයේ නිලීන ව ගිය ඇතැම් ගැඹුරුවූත්, හරවත්වූත්, ධර්ම කරුණු සරළ සුගම ලෙන්ගතු ශෛලියකින් ජන මනසට කා වැද්දවීමට උන්වහන්සේ සමත් ව සිටිති. ඇතැම්හු ගීතය තිරස්චීන විද්‍යාවක් ලෙස හඳුන්වා දෙමින් එකී කාර්යයෙහි නිරතවීම භික්ෂුවට අකැප වූත් සරුප් නොවන්නා වූත්, කාරණයකැයි හඳුන්වති. බුදු දහම පිළිබඳ ව නිවැරදි ව ගැඹුරු අවබෝධයකින් තොර එබඳු විචාරකයන්ගේ යථෝක්ත අදහස බැහැර කළ යුතු වූවක් ලෙස සැළකිය යුතු අතර බුදු දහම තුළ ගීත නිර්මාණ විෂයෙහි සම්මා දිට්ඨිය පෙරදැරි කර ගත් භික්ෂුවට කිසිදු තහංචියක් හෝ බාධාවක් නැත.

ඍග්වේද සාහිත්‍යයෙන් ඇරඹී ගී කාව්‍ය සාහිත්‍යය පිළිබඳ පළමු ව නිවැරදි විචාරයක් ඉදිරිපත් කළ ලොව පළමු චින්තකයා බුදුරජාණන් වහන්සේ බව මහාචාර්ය සෙනරත් පරණවිතාන පවසයි. ගීයක ඇතුළත් විය යුතු වාච්‍යාර්ථය හා ව්‍යංගාර්ථය යන අංශ දෙකට ධ්වනිතාර්ථය නැමැති සංකල්පය එකතු කරනු ලැබුවේ ආනන්ද

වර්ධන විසිනි. ඔහු එම අදහස ගොඩනගා ගත්තේ බුදු දහමේ ඇති ගීත සාහිතයය පිළිබඳ විචාරක මත හෙවත් බෞද්ධ සාහිත්‍යයේ බලපෑම මත යැයි ආචාර්ය ආනන්ද කුමාරස්වාමි පළ කර ඇති අදහස සැහැල්ලුවෙන් සලකා බැහැර කළ නොහැක. අංගුත්තර නිකායේ චතුක්ත නිපාතයේ එන කවි සූත්‍රයෙහි[1] කාව්‍ය රචකයන් පිළිබඳ ව වර්ගීකරණයක් දක්නට ලැබෙන අතර සංයුක්ත නිකායේ කවි සූත්‍රයේ[2] දී සැබෑ කවියා කෙබඳු කවීත්වයකින් හෙබි පුද්ගලයෙකු ද යන්න පැහැදිලි වේ. නූතන යුගයේ ගීත නිර්මාණකරණයට ප්‍රවේශ වූ යතිවරයන් වහන්සේලා ප්‍රධාන වශයෙන් පරපුර දෙකකට වර්ගකර දැක්වීම වඩාත් උචිත ය. එයින් පළමු පරපුර හැටියට ආචාර්ය වැලිමිටියාවේ ධම්මරක්ඛිත නාහිමි, රඹුකන සිද්ධාර්ථ හිමි, පල්ලේගම හේමරතන නාහිමි ද දෙවන පරපුර හැටියට පාතේගම ඤාණිස්සර හිමි, පොල්හේන්ගොඩ බුද්ධදත්ත හිමි, රූපහ සුමනජෝති හිමි, එප්පල පියනන්ද හිමි, වත්තේවැවේ ධම්මානන්ද හිමි, කෝන්වැවේ අරියරතන හිමි, කැටවල බුද්ධසිරි හිමි යන යතිවරුන් අපේ මතකයේ හැටියට සඳහන් කළ හැකි ය. මෙහි දක්වන ලද ආදි අපර දෙරපුර ම වර්තමානය දක්වා ද ගීත නිර්මාණ විෂයෙහි නැඹුරු වී සිටිති.

වර්තමාන ගීත සාහිත්‍ය විෂයෙහි මුලින් ම ගීතයක් නිර්මාණය කළ භික්ෂුව කවුරුන්දැයි කෙනෙක් මගෙන් විචාළ හොත් එකී මහඟු කාර්යයට අත පෙවූ පළමු භික්ෂුව හැටියට මා සඳහන් කරන්නේ කැළණිය විද්‍යාලංකාර පිරිවෙණේ වැඩ විසූ ආචාර්ය වැලිමිටියාවේ ධම්මරක්ඛිත නාහිමියන්ගේ නම ය. උන්වහන්සේ ගුවන් විදුලියට ගීත නාටක කිහිපයක් ම ලිවූහ. ශ්‍රී චන්ද්‍රරත්න මානවසිංහගේ සෝණ **ගංතෙර** ගීත නාටකයෙන් පසුව එච්. එම්. ගුණසේකරයන්ගේ ආරාධනාවෙන් ගුවන් විදුලි ගීත නාටක ලිවීමට බට ධම්මරක්ඛිත නායක හාමුදුරුවෝ පළමුවෙන් ම ලියූයේ **අනෝමා ගීත නාටකය යි.** කන්තක අසු අනෝමා ගංතෙර පතින අවස්ථාව ප්‍රතිනිර්මාණය කරමින් තුරඟා වන්නම ද ඇසුරු කරගෙන උන්වහන්සේ ලියූ ගීතය එකල අතිශයින් ජනප්‍රියභාවයට පත් විය. තුරඟාවණ්නාශම් නාද රටාව අනුව යමින් සිදුහත් කුමරුගේ අභිනිෂ්ක්‍රමන ප්‍රතිරූපනය කරද්දී ',





වැලිමිටියාවේ හිමියන් නැඹුරු වන බව පෙනෙන්නේ මහනුවර යුගයේ වඩාත් ප්‍රකට වුණ ශබ්දාලංකාර හා රිද්ම ලක්ෂණ වෙත ය. එහිදී උන්වහන්සේගේ වෘතාන්ත කථනයත්, මාධුර්යයත්, සංයමශීලි වෘත්තයත්, බුත්සරණ ඇසුරින් නිර්මාණය වූවක් නොවේ[3] යයි වත්තේවැවේ ධම්මානන්ද හිමියන්ගේ වී පතක් සොයා නැමැති ගීත සංග්‍රහයට **සිංහල ගීතයේ යති සම්ප්‍රදාය** නැමැති ලිපිය ලියමින් රත්න ශ්‍රී විජේසිංහ පවසයි. කවිය මෙන් ම ගීතය ද මානව ජීවිතය සරුසාර කිරීමෙහිලා අදාළ කොට ගත හැකි සුභාවිත කලා අංගයක් බව ප්‍රමාද වී හෝ වටහා ගත් භික්ෂූන් වහන්සේ ගීත රචනයට පිවිසුනහ. යනුවෙන් ඔහු පළ කරන අදහස ගම්‍යමාන කරන්නේ ගීත සාහිත්‍යයට භික්ෂුව ප්‍රවේශවීම අහම්බයක් නොවන බව නොවේය. , එකී කාර්යයට භික්ෂුව දැක්වූ දායකත්වය නිසා ගීත සාහිත්‍යය කෙත පෝෂණය කිරීමට දක්වා ඇති නිසඟ කුසලතාව හේතුවෙනි.

භික්ෂූන් වහන්සේ ජාතක කතා ආශ්‍රයෙන් නාට්‍ය ලියා ඒවා පන්සලේදී ආසන දෙකේ බණ කියන ආකාරයෙන් රඟ දැක්වූවා නම් සාර්ථක සිංහල ගීත වංශයක් බිහිවීමට ඉඩ තිබිණ. අතීතයේ සිටම භික්ෂූන් වහන්සේ නාට්‍යයටත්, සංගීතයටත් , ඇබ්බැහි නොවීම අලාභයක් යැයි මහාචාර්ය සිරි ගුණසිංහයන් පළ කරන අදහස මගින් හෙළි වන්නේ බෞද්ධ භික්ෂුව කාව්‍ය නාටක ශාස්ත්‍රාදියට ප්‍රවේශ කිරීම කෙරෙහි දක්වා ඇති මන්දගාමී ස්වභාවයයි. එය එසේ වීමට හේතු වූයේ භික්ෂූන් වහන්සේගේ ගීත රචනයට සම්මාදන්වීමේ කැපසරුප් බව පිළිබඳ පළ වූ අදහස් වන්නට පුළුවන.[4]

කෙසේ වෙතත් ගීත රචනා විෂයෙහි අනවරත අභිරුචියකින් එකී කාර්යය කෙරෙහි ශ්‍රී ලාංකික ජන විඤ්ඤාණය මැනවින් හඳුනාගෙන ක්ෂේත්‍රයට ප්‍රවේශ වූ රඹුකන සිද්ධාර්ථ හිමියෝ 1986 වර්ෂයේදි සංසාරේ අපි නැමැති ගීත සංග්‍රහය පළ කළහ. උන්වහන්සේ විසින් නිර්මාණය කල අතිශය ජනාදරයට පාත්‍ර වූ ගීත එහි ඇතුළත් වූ අතර ශ්‍රී ලාංකික භික්ෂුවකගේ ප්‍රථම ගීත සංග්‍රහය ලෙස ද එය හැඳින්වීම වටී. භික්ෂුව ගීත නිර්මාණයට ප්‍රවිෂ්ටවීම පිළිබඳව එවකට

නානාප්‍රකාර මතවාද පැවතුණි. සිද්ධාර්ථ හිමියෝ මෙසේ කීහ. **"ඇතැම් කෙනෙක් භික්ෂුන් වහන්සේ ගීත ලිවීම වැරදි දෙයක් ලෙස සලකා ගීත ලියන භික්ෂුන් වහන්සේට දෝෂාරෝපණය කිරීමට බැරි නැත. ඇතැම් කෙනෙක් භික්ෂුන් වහන්සේ ගීත ලිවීම හරි දෙයක් ලෙස සළකා ගීත ලියන භික්ෂුන් වහන්සේට ප්‍රසංසා කිරීමට බැරි නැත. විචාරය පිළිබඳ ජන සමාජයේ ස්වභාවය එයයි.**[5] කෙසේ වෙතත් ගීත නිර්මාණ කුසලතා සහිත භික්ෂූන් වහන්සේ විසින් ගීත සාහිත්‍යය පෝෂණයෙහිලා යම් මෙහෙවරක් කරන්නේ නම් මේ එයට කාලය යැයි උන්වහන්සේ ප්‍රකාශ කළහ.

රඹුකන සිද්ධාර්ථ හිමියන් රචනා කරන ලද ගීත අතර බහුල වශයෙන් පවතින්නේ ජනවහර භාවිත කරමින් ලියන ලද රචනාවන්ය. ජනවහර, කටවහර, පුරවහර, හා සෙව්වහර පිළිබඳ මනා පරිචයකින් පිරුණ උන්වහන්සේ වර්තමාන ජන කවියා වශයෙන් හැඳින්වීම සත්‍යයෙන් තොර වූවක් නොවේ. 70 දශකය ගීත රචනා ක්ෂේත්‍රයේත් ගීත නිර්මාණවලත් ස්වර්ණමය යුගය වශයෙන් විචාරකයෝ හඳුන්වති. එම යුගය ගීත රචනා ක්ෂේත්‍රයට අවතීර්ණ වූ අතර ස්වකීය අනන්‍යතාවය මෙන් ම රඹුකන සිද්ධාර්ථ ලකුණු සිංහල ගීතාවලියේ මැනවින් සනිටුහන් කිරීමට උන්වහන්සේ සමත් වූහ. එදා පැවති ගීත සම්ප්‍රදාය අනුව මුලින් ම බුදුහාමුදුරුවෝ යන වචනය ගීතයකට අරගෙන ආවේ උන්වහන්සේ ය. ගීත රචකයෙක් හැටියට බෞද්ධ ධර්ම සන්නිවේදනය තමාගේ එක ම තේමාව ලෙස තෝරාගෙන තිබේ. එදා මෙදා තුර කවියෝ ගද්‍යයෙන් මෙන් ම පද්‍යයෙන් ද බුදුගුණ වැණුහ.

**පරසතු මලින් පු ද**
**ලද මුණි සඳුට දිය න ද**
**වන පස මලින් පු ද**
**කළැයි පවසනු කවර වරද ද**[6]





දිව්‍යලෝකවල ජීවත්වන දෙවියෝ පරසතු මල් වලින් බුදුන් පුදති. මට එම මල් නැත. වන පස මල්වලින් බුදුන් පුදමි. එහි ඇති වරද කුමක්ද? දක්ෂ කවීහු ස්වකීය නිර්මාණ ප්‍රතිභාව අනුව බුදු බණ ප්‍රකාශ කළහ. මගේ නැණ පමණ එම බණ පද ශ්‍රාවකයා වෙත කවියෙන් කියමි. යනුයෙන් වැත්තෑවේ හිමියෝ ගුත්තිල කාව්‍යයෙහිලා පැවසූහ. එපරිදි වූ අච්චිපින්න නිර්මාණ උරුමයකින් පරිපෝෂිත සිද්ධාර්ථ හිමියන්ගේ ගීත අතර උන්වහන්සේගේ අනන්‍යතාව හා ප්‍රතිභාව පළ කරන බුදුගුණ ගීතයක් ලෙස බුදුහාමුදුරුවෝ ගීතය සඳහන් කළ හැකි ය.

**බුදුහාමුදුරුවෝ අපිත් දකින්නැති**
**බණත් අහන්නැති ඒ කාලේ**
**නිවන් දකින්නට පිංමදි වෙන්නැති**
**ඒකයි තවමත් සංසාරේ**

**දෙවුරම් වෙහෙරට යන්න එන්න ඇති**
**බුදුන් වඳින්නට ඒ කාලේ**
**නිවන් දකින්නට පිං මදි වෙන්නැති**
**ඒකයි තවමත් සංසාරේ**

**අපිත් එක්ක ගිවි අළේම යාළුවෝ**
**නිවන් දකින්නැති ඒ කාලේ**
**මෙතේ බුදුන් දැක නිවන් දකින්නට**
**පිං පුරවමු අපි සංසාරේ.**[7]

සංගීත නිර්මාණය - වික්ටර් රත්නායක
ගායනය - වික්ටර් රත්නායක

මෙම ගීතය තුළ සුවහසක් බෞද්ධ ජනතාවගේ හර්ද ස්පන්දනය කියැවේ. ඇතැම් හු මෙම ගීතය වන්දනා ගාථා අතර ගායනා කරමින් ම බුදුන් වැන්දාහ. සිත් වල ජනිත වූ බුද්ධාලම්බන ප්‍රීතිය භාව

ගීතයක් ලෙස ගැයූහ. සමහර භික්ෂූන් වහන්සේලා ධර්ම දේශනාවලට භාවිත කර ගත්හ. සංසාරයේ ස්වභාවය සහ සංසාරයේ නෑ සබඳකම් මෙසේ යැයි උන්වහන්සේලා කීහ. බාල තරුණ මහළු භේදයකින් තොර ව කොයි කවුරුත් මේ ගීතයට එක සේ ඇලුම් කළහ.

ගීතය තුළ දක්නට ලැබෙන සංශයාර්ථ පද කිහිපයකි. තමන්ට බුදුන් දකින්නට හැකි වුනත් ඒ බණ අසා නිවන් දැකීම පිණිස පිං කළා මදි වෙන්නැති. ඇතැම් විට දෙවුරම් වෙහෙරට පවා යන්න එන්නත් ඇති. අපේ යාළුවෝ ඒ බණ අසා නිවන් දැක්කත් අපට ඒ සඳහා පිං වරම් අහිමි වෙන්න ඇති එසේ වූ බැවින් අපි තාමත් සංසාරේ උපදිනවා ඇති යන හැඟීම පොදු ජනතාව අතර පවතින්නක් වුව ද මෙය එක්තරා බුද්ධිමත් පිරිසකට කුතුහලය උපදවන්නක් ද විය. මන්ද නිවන් දකින්නට පිං මදි වෙන්න ඇති පදය නිසා ය. සංසාරයේ පුද්ගලයා නැවත නැවත උපදින්නේ පිං මදි කමත් පව් වැඩි කමත් නිසා ය. පිං මදි වෙන්න ඇති නොව පිං මදි වෙලා යයි ඔවුහු තර්ක කළහ. නමුත් රචකයා නිර්මාණාත්මක ලෙස එතැන අදාළ සංශය පදය යොදා තිබීම ගීතය තුළ භක්ති රසය ජනිත කිරීමට සමත් වී ඇති බව තේරුම් ගත් ඔවුහු නැවත රචකයාගේ යතී රීතියේ ප්‍රතිභා ප්‍රභාව පිළිබඳ මවිතයට පත් වූහ. අපිත් එක්ක සිටි අපේම යාළුවෝ නිවන් දකින්නැති යැයි සිතෙන විට එකවර සිහියට නැගෙන්නේ

**ඉඳ ඉඳ එක වෙහෙ** ර
**විඳ විඳ දහම් මනහ** ර
**සිඳ බිඳ දුක් සස** ර
**අහෝ දෙව්දත් නොදුටු මොක් පු** ර[8]

යනාදී වශයෙන් බුදු බණ නාසා කටයුතු කළ අය පිළිබඳව ය. දේවදත්ත. සාති වැනි භික්ෂූන් වහන්සේලා බුදුන් දැක නිවන් දකින්නට නොහැකි වූ අල්ප ඥානයෙන් හෙබි අයත්, විංචිමානවිකාව වැනි බුද්ධ චිවරය හැල්එවට ලක් කළ අයත් අප මතකයට නැගේ. ඒ පිරිස අතර කොහේ හෝ අයිනක අපත් සිටින්නට ඇතැයි යන





කල්පනාව විසින් හුදකලාව සිට නැවත බලාපොරොත්තු වලින් සිත පුරවයි. එනම් **මෙතේ බුදුන් දැක නිවන් දකින්නට පින් පුරවමු** යන පාදය ශ්‍රවණය කිරීමෙනි. ජන කවියා බුදුන් වඳින පරිදි රචකයා තුළ පැවති සරළ බවත්, අව්‍යාජ බවත්, මින් ජනිත වේ. අසූව දශකයේ අතිශයින් ජනප්‍රිය වූ බුදු හාමුදුරුවෝ ගීතය එසේ ජනප්‍රිය වීමෙහි ලා බලපෑ සුවිශේස වූ කාරණා රාශියක් ඇතැයි සිතේ.

එනම්

01 බුදුහාමුදුරුවෝ යන කට වහරේ එන වචනය ප්‍රබල ලෙස ගීතයේ භාවිත වී තිබීම

02 ගීතය පුරා පැතිර යන අව්‍යාජ බව

03. බුදුහාමුදුරුවෝ අපිත් දකින්නැති යන ජන විඤ්ඤාණයේ පවතින අදහස ප්‍රබල ලෙස සංනිවේදනය වී තිබීම.

04. සංසයාර්ථ පද සහිත ගලා යන වචන පෙළ

05. මෛත්‍රී බුදුන් දැක නිවන් දකින්නට බෞද්ධයා තුළ ඇති කැමැත්ත සහ බලාපොරොත්තුව

මේ ගීතය ලිවීමට අදහස කෙසේ රචකයාගේ හිතට නැගුණේ ද යන ගැටළුව මගේ සිතේ තවම නොවිසඳී පවතින්නෙකි. බුදුහාමුදුරුවෝ යන උච්චාරණයත් සමග ම එය එතැනින් කෙළවර වේ. අඛණ්ඩ ව ගලා යන පද පෙළකට මේ වචනය යොදා ගත්තේ කෙසේ ද, අපිත් බණත්, යන වචන වල "ත්" යන්න ගීතය ගලා යන්නට ඉමහත් ආලෝකයක් ලබා දුන්නා නොවේ ද යති රීතියේ පෙළහර මෙය නොවේ ද ගීයේ පද පෙළ කියවා යන විට රඹුකන සිද්ධාර්ථ හිමි නැමැති රචකයා ඒ පද පෙළ අතර සිටිතැයි හැඟේ. එදා මෙදා අතිශයින් ජනප්‍රිය, ගායකයාට වුව ද වාසනාව කැඳ වූ මෙම ගීතය සදාතනික කලාකෘතියක් බවට පත් වන්නේ අසහාය බොදු බැති ගීතයක් ලෙසිනි.

සංසාරය පුරා අපි අනවරත දිගු ගමනක නිරත ව සිටින්නෙමු. ඒ ගමන අවසාන වන්නේ කවර දා හෝ ප්‍රඥාව විකසිත වී නිර්වාණය නැමැති තුමුල් ප්‍රාප්තිය කරා ප්‍රවේශ වූ විට ය. එසේ වූ සත්ත්වයෝ සංසාරය පුරා නොයෙක් දුක්ඛදෝමනස්සයන් අත්විඳිමින් සැරිසරති.

බුද්දෝත්පාද කාලයක උත්පත්තිය ලබන්නට හෝ පින් කරති. කවදා හෝ බුදුන් දැකීම සෑම සත්ත්වයෙකුගේ ම ප්‍රාර්ථනයයි. බුදුහිමිගේ සෙවනේ සිසිල මොන තරම් සුවයක් ද? සැනසීමක් ද?

**සසර දනවුවේ දුක් පීඩා විඳ**
**නවාතැන් සොයා අප යනවා**
**ඒ යන ගමනේ කොතනක දී හෝ**
**බුදුහිමි සෙවනේ සිසිල ලැබේවා**

**දනිමි හැඳින්නෙමි ගුණ තුන් රුවනේ**
**නිවමි නිවන්නෙමි දුක බව ගිමනේ**
**සරමි සරන්නෙමි සඳහමි අරණේ**
**ගයමි ගයන්නෙමි බුදු ගුණ වරුණේ**

**මලකින් මලකට පාවෙන සුවඳයි**
**සවනින් සවනට යාවෙන මිහිරයි**
**පහනින් පහනට දැල්වෙන එළියයි**
**අඳුරෙන් එළියට යන මිණි පහනයි** [9]

සංගීතය - ඩබ්ලිව්. ඩී. අමරදේව
ගායනය - ඩබ්ලිව්. ඩී. අමරදේව

අප ජීවත් වන්නේ සංසාරය නැමැති ගම්මානයේ ය. මෙම ගම්මානයේ නෙක දුක් පීඩා විඳ නවාතැන් සොයාගෙන යමු. ඒ යන ගමනේ කොතන කොයි ස්ථානයක දී හෝ බුදුහිමි සෙවනෙහි සිසිලක් ලැබේවා යන්න අප කොයි කාගේත් ඒකායන ප්‍රාර්ථනයයි.

**වැනුවා නම් බුදු ගුණ වැනුවාම ය**
**තැනුවා නම් තම සිත තැනුවාම ය**
**දෙනුවා නම් දන් පිං දෙනුවාම ය**
**දිනුවා නම් පරලොව දිනුවාම ය** [10]





බුදු ගුණ වැනීමත් ,බුදු බණ පිළිපැදීමත්, පරලොව දිනීමත් බෞද්ධයා සතු ව පවතින එක ම ප්‍රාර්ථනය වේ. යථෝක්ත පදනමේ පිහිටා රචනා වූ සසර දනව්වේ නැමැති ගීතය සත්ත්වයා අඳුරෙන් එළියට කැඳවන්නට රචකයා දැල්වූ පහනක් වැන්න.

දනිමි හැඳින්නෙමි ගුණ තුන් රුවනේ
නිවමි නිවන්නෙමි දුක් බව ගිමනේ
සරමි සරන්නෙමි සඳහම් අරනේ
ගයමි ගයන්නෙමි බුදු ගුණ මහිමේ

යන පදයත් සමග අප සිත මැවී පෙනෙන්නේ වෙහෙර මළුවේ බුද්ධානුස්සති බවුන් වඩන උවැසුවෙකි. හෙතෙම තුන්රුවනේ ගුණ මැනවින් අවබෝධ කර ගත්තේ ය. භවයේ දුක මැනවින් අවබෝධ කර ගත්තේ ය. ඒ නිසා ම සද්ධර්මය නැමැති අරණේ ජීවත්වෙමින් බුදු ගුණ සිහිපත් කරයි. මලකින් මලකට පාවෙන සුවඳ ද සවනින් සවනට පාවෙන මිහිර ද පහනින් පහනට දැල්වෙන එළිය ද සත්ත්වයා අඳුරෙන් එළියට අරගෙන යන ධර්මාවබෝධයයි.

**යෝ ධම්මං පස්සති, සෝ මං පස්සති, යෝ මං පස්සති, සෝ ධම්මං පස්සති.** යමෙක් ධර්මය දකී ද හේ මා දකී, යමෙක් මා දකී ද හේ ධර්මය දකී. යනුවෙන් බුදුහු පවසති. උන්වහන්සේ දැකීම ධර්මය දැකීමක් ලෙස ද , ධර්මය දැකීම බුදුන් දැකීමක් ලෙස ද , අන්‍යෝන්‍ය වශයෙන් සම්බන්ධ කොට දකිති. යමෙක් ධර්මය මැනවින් අවබෝධ කර ගත්තේ ද හෙතෙම ජීවමාන බුදුන් දැක්කේ වේ. රචකයා ගීතය මගින් මතු කරන්නේ යථෝක්ත බුද්ධ භාසිතයේ ඡායාවයි. හුරු පුරුදු සරල සිංහල වදන් භාවිතයෙන් මිදී හුදෙක් මිශ්‍ර සිංහල හා සංස්කෘත භාෂාවේ ආලෝකය ලබමින් රචනා කළ බුදු ගුණ ගීයක් ලෙස **"සද්ධර්ම මකරන්ද"** ගීතය හැඳින්විය හැක. පද පෙළ ඇසූ පමණින් රචකයා හඳුනා ගතහැකි ගී රීතියෙන් මිදී ලියූ මෙය මාත්‍රා දහනමයට සීමා වූ එකම විරිතෙන් ගලා යයි.

**සද්ධර්ම මකරන්ද පද රශ්මි ජාලා**
**මුනි චන්ද්‍ර ජයකේතු ආකාශ මාලා**
**පර දුක්ඛ භව නාථ හිමි බුද්ධ ලීලා**
**දුක සෝක සංතාප පලවා හරිත්වා**

**දින සූර්ය රජ වංශ මුනි කේතු මාලා**
**දින චන්ද්‍ර පිය රාජ මුනි මන්ත්‍ර ජාලා**
**භව දුක්ඛ ජය නාථ හිමි බුද්ධ ලීලා**
**දුක සෝක සංතාප පලවා හරිත්වා**

**මනු වංශ කුල ජාත අභිරූප ලීලා**
**මුනි වංශ ගුණ ඥාණ සද්ධර්ම ජාලා**
**තිර සාර ඝණ නාථ හිමි බුද්ධ ලීල**
**දුක සෝක සන්තාප පලවා හරිත්වා** [11]

සංගීත නිර්මාණය - විශාරද ගුණදාස කපුගේ
ගායනය - විශාරද ගුණදාස කපුගේ

වර්තමාන ශ්‍රී ලංකාව තුළ ජීවත් වන මිනිසාගේ ජීවිතය අතිශයින් ම වේදනාකාරී බවට පත් වී තිබේ. දුක් ගින්දරේ තැවෙමින් සිටින මිනිසාට සැනසිල්ලක් පවා අහිමි ය. සඳහම් දිවයින ලෙස පතළ වුව ද දින දින ඇසෙන්නේ සිත් සතන් අවුල් වියවුල් කරන අසංවර අවර පක්ෂයේ ක්‍රියාකාරකම් ය. දින දින නෙත් මායිමට එන්නේ ඇසට කඳුළු අරන් එන උණුසුම් සිදුවීම් ය. එදා විශාලා මහනුවර ඇති වූ තුන් බිය මෙදා ශ්‍රී ලංකාවට පාත් වූවා සේ ය.

දොර දොර මිණි බෙර,
ගෙය ගෙය හඬය බියකර,
පිල පිල අදින මර,
දුගී ගිලනුන්ගෙන් නැත වසර [12]





යනාදී වශයෙන් එදා විශාලා මහනුවර සේ ම මෙදා ශ්‍රී ලංකාවේ පවතින්නේ එබඳු තුන් බියකි.

1. යුද්ධයේ භීෂණයෙන් ඇතමෙක් මිය යති.
2. රැකියා දුර්ග මාර්ගයේ කෙනෙක් අසරණ වෙති.
3. රටේ අනාගතය පිළිබඳ අවිනිශ්චිත බවකි.

මේ තුන් බියෙන් අප මුදා ගන්නවා නම් ඒ සඳහා බුදුන් වහන්සේවත් වැඩම කළ යුතු ය. උඩින් වැඩ යමා මහ පෙළහර පා චූලෝදර මහෝදර සංසිඳ වූ අයුරු අප අසා ඇත. විශාලා මහනුවරට වැඩම කොට පිරිත් කියා පිරිත් පැන් ඉස එම ව්‍යසනයෙන් සත්ත්වයා ගොඩගත් අයුරු අප මතකයේ ඇත. එසේ උඩින් වැඩමවා දුක් ගින්දර නිවනු මැනවි.

**ශාක්‍ය සිංහ සනරාමර**
**ඥාන විභූෂිත බුද්ධ දිවාකර**
**ලොවුතුරු බුදු පියාණෙනි**

**හදින් හද නැගෙන්නේ වේදනා ගිනි දළු ය**
**නිවන් පුර පෙනෙන්නේ ගවු ගණන් දුර ලෙස ය.**
**බුදු පියාණෙනි අපට දුක් ගැහැට අපමණ ය.**

**පෙර දවස පෙර දිගට ගීතයක් වූ රටක**
**ගමින් ගම දාගැබක් පන්සලක් ඇති රටක**
**මිනිස් මුව පෙනෙන්නේ සිනා නොව කඳුලැලි ය**
**මිනිස් සිත නැගෙන්නේ කවි නොවේ යාදිනි ය**

**අද දවස ලක්බිමේ හදින් හද නැගෙනා**
**අද දවස ලක්බිමේ තැනින් තැන ඇසෙනා**
**සුසුම්ලන විලාපය නිවාලනු මැන සමිඳ**
**උඩින් වැඩ යමා මහ පෙළහරක් පාන සේ** [13]

සංගීත නිර්මාණය - රෝහණ වීරසිංහ
ගායනය - ඩබ්ලිව්. ඩී. අමරදේව

බෞද්ධ ධර්ම සන්නිවේදනයෙහි ලා ගීත රචනා කරන බොහෝ රචකයන් අතර සිද්ධාර්ථ හිමියන්ට සුවිශේෂී තැනක් හිමිවෙයි. උන්වහන්සේ ලියූ , **බුදුහාමුදුරුවෝ, සසර දනව්වේ, සද්ධර්ම මකරන්ද , ශාක්‍ය සිංහ සනරාමර** යනාදී ගීත මෙහිලා සාකච්ඡාවලට ලක් කරන ලදී. මෙම ගීත ගායනා කරනු ලැබ ඇත්තේ වික්ටර් රත්නායක, අමරදේව, ගුණදාස කපුගේ යන ප්‍රවීණ ගායකයන් විසිනි. එම සාකච්ඡාවෙහි ලා පැහැදිලි ව දැකිය හැකි වූ ලක්ෂණය නම් එම ගීත සියල්ලම බෞද්ධ පසුබිමක ලා ලියූ විවිධ තේමා ගත් ගීත ඒ අතර පවතින බවයි.

අපට ඇසෙන බෞද්ධ ගීත පිළිබඳව සාකච්ඡා කරන විට සමස්ත ගීත ප්‍රධාන වශයෙන් කොටස් හයකට වර්ග කොට දක්වා සාකච්ඡා කර හැකිය. එනම්

1. බුදුරජාණන් වහන්සේගේ රූපකාය පිළිබඳ ලියවුණු ගීත
2. බුදුරජාණන් වහන්සේගේ ධම්කාය පිළිබඳ ලියවුණු ගීත
3. බුදුරජාණන් වහන්සේගේ ගුණකාය පිළිබඳ ලියවුණ ගීත
4. බුදුරදුන්ට කියාපාන යාදිනි හෙවත් ගැනවිලි ලෙස ලියවුණු ගීත
5. බෞද්ධ පදනමක සිට ලියූ විරෝධාකල්ප ගීත
6. ප්‍රාර්ථනා ගීත

යනුවෙනි. මෙම වර්ග කිරීම අනුව යථෝක්ත ගීත කුමන අයුරකින් රචනා වී තිබේ ද යන්න සොයා විමසා බැලීම ශ්‍රාවකයා විසින් කළ යුතු වෙයි.

බුදුහාමුදුරුවෝ ගීතය බුදුහිමියන්ගේ ගුණකාය හා ප්‍රාර්ථනා ගීතයක් ලෙසින් ද , සසර දනව්වේ ගීතය ප්‍රාර්ථනා ගීයක් ලෙසින් ද , සද්ධර්ම මකරන්ද ගීතය බුදුහිමියන්ගේ රූප කාය හා සම්බන්ධ ගීයක් ලෙසින් ද, ශාක්‍ය සිංහ සනරාමර බුදුරදුන්ට කියාපාන යාදිනි හෙවත් ගැනවිලි කියා පාන ගීතයක් ලෙසින් ද , ලියවී තිබේ. ගීත රචකයෙකු වශයෙන් රඹුකන සිද්ධාර්ථ හිමියන්ගේ ගී රීතිය සවිමත් ප[illegible]ක පිහිටා ඇති බව යථෝක්ත ගීත විමසීමේ දී පැහැදිලි වෙයි.





## 1.2 උපදේශ ප්‍රදානය හා සංනිවේදනය

රඹුකන සිද්ධාර්ථ හිමියන්ගේ ගීත නිර්මාණ රීතිය පොබ කළ උපදේශාත්මක ගීත නිර්මාණ රාශියකි. උපදේශ ග්‍රන්ථ සාහිත්‍යය පිළිබඳ ව සලකා බලන කළ **හිතෝපදේශය , පංචතන්ත්‍රය , සුභාෂිතය , ලෝකෝපකාරය** වැනි ග්‍රන්ථ අමතක කළ නොහැකි ය. යථෝක්ත ග්‍රන්ථ මගින් පාඨක දනමන උසස් තත්වයකට ගෙන ඒම පිණිස මහඟු කාර්යයක් සිදු කොට තිබේ. පුද්ගලයන් තුළ පවත්නා විවිධ දුර්වලතා හඳුනා ගන්නටත් , එම දුර්වලතා මහහැර යහපත් පුද්ගලයන් ලෙස ජීවත්වන්නටත් ඒ මගින් යහපත් ප්‍රවේශයක් සපයනු ලබයි.

උතුම් පුද්ගලයාත්, අධමයාත් අතර අප ජීවත් වන සමාජ පරාසය තුළ සුවිශේෂ වෙනස්කම් තිබේ. දුර්ජන පුද්ගලයා කළ උපකාරය උපකාරයක් ලෙස නො දකී. ඔහුට උපකාර කළ පුද්ගලයා ම වෙහෙසට පත් කරවයි. ජාතක පොතේ මහාකපි ජාතකය මගින් විමර්ශනය කරනු ලබන්නේ ද මෙම යථාර්ථය මයි. තමා වැටී සිටි නරා වලෙන් ගොඩගත් වඳුරා මරා මස් කෑමේ ආසාවක් දුර්ජන මිනිසා තුළ හට ගන්නා ආකාරයත්, නමුත් උතුම් ගුණ ධර්මයෙහි පිරි බෝසත් වඳුරා තමාට වැදුණු මරු පහර ද ඉවසා මං මුලා වූ මිනිසාට ගමට යාමට මග පෙන්වූ අයුරුත් එහි නිරූපිතය මෙම සදාතනික ධර්මතාව ප්‍රත්‍ය ශතකය හෙළි කරන්නේ මෙසේය.

උත්කෘෂ්ට මධ්‍යම නිකෘෂ්ට ජනෙෂු මිත්‍රං
යද්වත් ශිලාෂු සිකතාෂු ජලේෂු රේඛා
වෛරං ක්‍රමාදධම මධ්‍යම සජ්ජනේෂු
යද්වත් ශිලාෂු සිකතාෂු ජලේෂු රේඛා

උතුම් මිනිසාට කළ උපකාරය ගලෙහි කෙටූ ඉරක් මෙන් ඔහුගේ මතකයේ රැඳෙයි. ඔහුට කළ සතුරුකම දියෙහි ඇඳි ඉරක් මෙන් ඔහුගේ මතකයෙන් මැකී යයි. අධමයාට කළ උපකාරය දියෙහි ඇඳි ඉරක් මෙන් ඔහුගේ මතකයෙන් මැකී යයි. ඔහුට කළ විරුද්ධකම

ගලෙහි කෙටූ ඉරක් මෙන් මතකයෙහි කාවද්දාගෙන සිටී.

සුභාෂිතය කතුවරයා ද මේ අදහස ම කවියෙන් කියා තිබේ.

නැණැති දනන් හට මද ගුණයක් කළ ද
පවති ගල කෙටූ අකුරක් මෙන් තිබ ද
විමති දනන් හට කළ කිසි ගුණ නොම ද
එනැති වේය දියපිට ඇඳි ඉරක් ලෙ ද

යථෝක්ත සාහිත්‍ය ආභාසය නොමද ව ලබමින් රඹුකන සිද්ධාර්ථ හිමි ලියූ යට දැක්වෙන ගීතය වර්තමාන අරුමෝසම් සමාජයේ ජීවත් වන දූර්ජන මිනිසුන්ගේ ස්වභාවය හෙළි කරයි. යති රිතියට යටත් කොට කරුණා දයාව පෙරදැරි ව පද පෙළ ගලපා ඇති බව පෙනේ.

**කළ ගුණ නොදැනුනාට**
**දඬුවම් නොලැබුණාට**
**බෝසත් මිනිස්සුන් අතින්**
**දුර්ජන කමේ පවට**
**දඬුවම් ලැබුණුදාට**
**ඉකිබිඳ අඩාපන් ඉතින්**

**හිත හොඳ නැති වුනාම**
**යහගුණ මිය ගියාම**
**මිනිසකුගෙන් කිම ද පලේ**
**ඒ බව වැටහුණාම**
**සිතිවිලි තනි වුනාම**
**තමනුත් නෑ තමන්ට අනේ**

**මුදලට වාසිවලට**
**සෙනෙහස දිය වුනාම**
**ජීවිතයක සතුට නෑ අනේ**
**දෑසේ කඳුලුවලට**
**ඉඩ ඇති පහන් පැලට**
**කවුරුද සුසුම් පා කළේ**

සංගීතය - විශාරද ගුණදාස කපුගේ
ගායනය - සෙනෙවිරත්න වත්තිනායක





අප ජීවත් වන සමාජ පරිසරය තුළ වුව ද මෙවැනි කළ ගුණ නොදත් පුද්ගලයන් එමට ය. ජීවිත යථාර්ථය හරි හැටි නොදැන තණ්හා වසඟ ව දිවි ගෙවන දූර්ජන සිත් වලින් පිරුණු පුද්ගලයන්හට තම ගති ස්වභාවය නිසා බොහෝ දුක් කන්දරා අත්විදීමට සිදුවෙයි. මිනිසාගේ වටිනාකම ඇත්තේ යහපත් බවෙහි ය. බලන් මේ අරුමය - යහපත් බවෙහි ශාපය යනුවෙන් බර්ටෝල්ඩ්බ්‍රෙෂ්ට් හුණුවටයේ කථාව නාට්‍යයෙහිලා කීව ද සත්‍ය වශයෙන් ම එය පුද්ගලයාට හෝ සමාජයට ශාපයක් වන්නේ ද?

හොඳ හිත නැති වුණාම යහගුණ මිය ගියාම සත්‍ය වශයෙන් ම මිනිසාගේ ඇති පළය කුමක්ද? ගුණ නැණ පිරි උතුම් පුද්ගලයන් සමාජයක කොපමණ සිටියත් එබඳු පුද්ගලයන් සමාජයට වැඩිවීමක් නොමැත. බෝසත් ගුණ දහම් වලින් පිරි පුද්ගලයාට කළ ගුණ නොදත් දූර්ජනයන් විපතක් කළ ද ඔවුන්ගෙන් පෙරලා අයහපතක් නො ලැබෙයි. නමුත් දිනෙක ස්වභාව ධර්මය විසින් දඬුවම් ලැබෙයි. එදාට ඔහු බොහෝ සෙයින් කම්පාවට පත් වන්නේ යයි රචකයා කරනු ලබන ප්‍රකාශය විසින් අපේ මතකය ගෙන යන්නේ මහාකපි ජාතකය වෙත ය. මිනිසා කළ දූර්ජන ක්‍රියාවට බෝසත් වඳුරාගෙන් පෙරලා අයහපතක් නො වෙයි. නමුත් අතිශය දූර්භාග්‍යසම්පන්න ලෙස එම මිනිසා මරණයට පත් වන්නේ චර්ම රෝගයක් සෑදී තමා ද තමාට එපා වීමේ තත්ත්වයකට පත්වීමෙන් අනතුරුව ය.

මධුවා මඤ්ඤති බාලෝ
යාව පාපං න පච්චති
යදා ච පච්චති පාපං
අථ බාලෝ දුක්ඛං නිගච්ඡති [17]

අනුවණ පුද්ගලයා පව් කරන විට එම පාප ක්‍රියාව මී පැණි සේ මිහිරි ලෙස සිතයි. එම පව විපාක දෙන විට අතිශය දුකට පත් වෙයි.

ලෝවැඩ සඟරා කතුවරයා ද මෙම ධර්මෝපදේශය දෙයි.

කරන කලට පව් මීරිය මී සේ
විඳින කලට දුක් දැඩි වෙයි ගිණි සේ
ඇඳින එ පව් දුරලන උපදේ සේ
නුදුන මැනවි තුන් දොර අවකා සේ [18]

පව කරන විට මීපැණි මෙන් මිහිරි ය
එහි විපාක විඳින විට ගින්දර සේ ය
මෙම උපදේශය මැනවින් හඳුනා ගෙන
තුන්දොර පව් කරන්නට ඉඩ නො දිය යුතු ය.

ලෝවැඩ සඟරාවේ කතුවරයා පව් කිරීමට තුන් දොර වසා දැමිය යුතු යයි කියන්නේ ඇයි. එහි විපාක විඳින කොට කඳුලු පිරි මුහුණින් යුතු ව විඳීමට සිදුවන නිසා ය.

**යස්ස අස්සු මුඛෝ රෝදං විපාකං පටිසේවති** [19] කඳුලු පිරි මුහුණින් යුතු ව විපාක විඳීමට සිදුවන්නේ නම් ක්‍රියාව නො කිරීම යහපති. යන බණ පදය දූර්ජන කමේ පවට දඬුවම් ලැබුණදාට ඉකිබිඳ හඬාපන් ඉතින් යනුවෙන් පවසයි. කළගුණ නො දන්නා දූර්ජනයෙකි. එහි පවට විපාක වශයෙන් අත්වන්නේ ඉකිබිඳ අඬමින් පව විපාක විඳීමට ය.

යට දැක්වෙන ගී පද මාලාව විසින් ද සමාජයට සංනිවේදනය කරනු ලබන්නේ ද යථෝක්ත යථාර්ථයම යි.

**දිවෙන් දිව ගා සිටියත් දවසක**
**මතුවෙයි දුදනන් ගති නපුරු**
**ඒ දුදනන්ගේ මිතුරු සිනාවත්**
**මතු දා විපතක පෙර ලකුණු**

**කිරෙන් දෙවුවත් නෑ සුදු වන්නේ**
**ගින්නෙන් දා ගිය දා අඟුරු**
**මලින් පිදුවත් නෑ හැරලන්නේ**
**දුදනන් සිත් බැඳි කටු පඳුරු**





**පවින් පිරුණු දුදනන්ගේ ඇසුරින්**
**ලැබුණේ සැමදා ගල් මුඟුරු**
**ඒ මඟ හැර ගිය මිනිසුන් ලැබුවා**
**දෝත පිරෙන්නට මල් පොකුරු** [20]

සංගීත නිර්මාණය - වික්ටර් රත්නායක
ගායනය - වික්ටර් රත්නායක

**අසේවනා ච බාලානං, පණ්ඩිතානං ච සේවනා** [21] (අනුවණයන් ඇසුරු නො කරන්න. උතුම් දැන උගත් පණ්ඩිතයන් ආශ්‍රය කරන්න) එය උතුම් මංගල කරුණක් ලෙස බුදු සමය උගන්වයි. යහපත් අනාගතයක් බලාපොරොත්තු වන්නා විසින් ආරම්භයේදී ම කළ යුතු වන්නේ එයයි. නපුරු දුදන ඇසුර නිතර හිතට දුකක් වන්නේ ය. සුභාෂිතය කතුවරයා මෙය ප්‍රකාශ කරන්නේ දූර්ජන මිනිසා ද පරිසරයේ ජීවත් වන අන්‍ය ජීවීන් ද සංසන්දනය කරමිනි.

කුරිරු ගොර සපුන්ගේ දළගෙහි විසය
මදුරු මැසි කැළැන්ගේ තුඩගෙහි විසය
රුදුරු නුහුසුවන්ගේ වලිගෙහි විසය
නපුරු දුදනන්ගේ සියොළගෙහි ම විසය [22]

විෂ ඝෝර සර්පයා ද , මදුරු මැස්සන් ද , ගෝනුස්සන් ද, මිනිසාගේ සතුරන් ය. එබඳු විස සත්ත්වයන්ගෙන් මිනිසාට හානි හා අන්තරාය සිදු වෙයි. නමුත් එම සතුන්ගේ ශරීරයේ එක් තැනක පමණක් මේ විෂ පවතී. නපුරු දූර්ජන පුද්ගලයා එසේ නො වෙයි. ඔහුගේ විෂ ඇත්තේ ශරීරයේ එක් ප්‍රදේශයක නොවේ. සියොළඟ ම ය. එබඳු පුද්ගලයන්ට කොපමණ ගුණ කළත් පලක් නො වන බවත්, එසේ ගුණ කරන්නාට ම පෙරලා විපත්තියක් කරනු ලබන බවත් කියැවේ.

යථෝක්ත යථාර්ථය ගීයට නැගීමේ දී රචක හිමි නම ජන වහර ඇසුරින් සැකසුණු අප්තෝපදේශය යොදා ගනී. ගීතය අරඹන්නේ එතනිනි. **දිවෙන් දිව ගා සිටියත් දුදනා දුදනා ම යි.** යන පදය මගින් පුද්ගලයාට අඟවන්නේ ඔවුන් ඇසුරු කිරීමෙන් ඈත් වන්න කියා ය. ඔවුන් පාන මිතුරු සිනාව ද සැබෑ මිත්‍රත්වයක් නො වේ. එය ද මතු

දවසක විපතකට මුල ය. කිරෙන් දෙවුවත් නෑ සුදු වන්නේ ගින්නෙත් දා ගිය දෑ අඟුරු යන පදය විසින් අප මනස කැන්දාගෙන යන්නේ ගුත්තිල කාව්‍යය වෙත ය. එහි මෙබඳු කවක් වෙයි.

**කොපමණ ගුණ කළ ත්**
**දුදනෝ නොවෙති යහප ත්**
**කිරි දියෙනි දෙවුව ත්**
**අඟුරු සුදුවන කලෙක් නම් නැ ත්** [23]

ගුත්තිල පඬිතුමා මූසිලයා හට ශිල්ප උගැන්වීම ප්‍රතික්ෂේප කරයි. එයට හේතුව ඔහුගේ ශරීර ස්වභාවය පරීක්ෂා කිරීමේ දී පෙනුන දුර්ජන ස්වභාවය නිසා ය.

නමුත් අඳ මව්පියන් දෙදෙනාගේ ඉල්ලීම නිසා දුර්ජන පුද්ගලයා වුව ද තම ශිල්ප ඥාණය නැමැති නෞකාවෙන් සිප් සතර පරතෙරට පැමිණ වූයේ ය. නමුත් අවසානයේ සිදු වූයේ කුමක්ද? තම දුර්ජන ශිෂ්‍යයා සමඟ වාදයකට පැටලීමට ය. එම අවස්ථාවේ ගුත්තිල පඬිතුමාට පුරාණ සිද්ධිය මතකයට නැගෙන්නට ඇත. තමා කළ සියළු ගුණ අමතක කළ ශිෂ්‍යයා අද තමා හා සටනකට එළඹී ඇත. දුන් ශිල්ප පිළිබඳ මතකය වත් ඔහු සතු ව ඇතැයි සිතිය නො හැකි ය. කිරි වලින් දෙවුවත් අඟුරු සුදු නො වන උපමාව ඔහු සිතට නැගෙන්නේ ඒ නිසා ය. සුදු පිවිතුරු උතුම් බවෙහි සංකේතය යි. කළු දුර්ජන පාප බවෙහි සංකේතයයි. සිද්ධාර්ථ හිමියන් ගීතයෙහිලා යථෝක්ත සම්භාව්‍ය මහෝපදේශ රීතිය අනුව යමින් කියා දෙන්නේ කුමක්ද? තම ඇසුරට එන මිත්‍රයා කවුරුන්දැයි පළමු ව නිවැරදි ව හඳුනා ගත යුතු බවයි. උන්වහන්සේ ආරාධනා කරන්නේ යහපත් සත්ජන ඇසුරක් සඳහා ය.

**පවින් පිරුණු දුදනන්ගේ ඇසුරින්**
**ලැබුණේ සැමදා ගල් මුගුරු ද**
**ඒ මඟ හැර ගිය මිනිසුන් ලැබුවා**
**දෝත පිරෙන්නට මල් පොකුරු ද**

දෝත පිරෙන්නට මල් පොකුරු ලබා ගන්නේ කෙසේ ද? ඒ යහපත් සත්ජන මිත්‍ර ඇසුර මගිනි. මිතුරෙකු අහිමි ව ජීවත් වීම පළ රහිත එකකි. මිත්‍රයන් අත්‍යවශ්‍ය ම ය. නමුත් නිවැරදි මිතුරා කවුද යන්න ඔහු මැනවින් හඳුනා ගත යුතු වේ.





උත්සවේ ව්‍යසනේ චෛව
දුර්භික්ෂෙ රාෂ්ට විප්ලවේ
රාජද්වාරේ ශ්මශානේ ච
යඃ තිෂ්ඨති ස බාන්ධවාඃ [24]

උත්සවයේ ද , ව්‍යසන අවස්ථාවේ ද, ආහාර නොමැති අවස්ථාවේ ද, අවුල් වියවුල් පවතින සමයෙහි ද, රජ මැදුරේ ද දූකේදී ද, සැපේදී ද එකට සිටීනම් ඔහු පරම වූ මිත්‍රයෙකි. එසේ වූ උතුම් මිත්‍ර සමාගම යහපත ම උදා කරයි. එබන්දෝ කල්‍යාණ මිත්‍රයෝ ය. පාප මිතුරන් සිව් දෙනෙකු පිළිබඳවත්, බුදුහු සිඟාලෝවාද සූත්‍රයෙහි ලා දෙසූහ. තම නිවසේ හොඳ ම මිතුරිය තම මව බව (මාතා මිත්තං සකෙ ඝරෙ) උන්වහන්සේ අවධාරණය කළහ. සිද්ධාර්ථ හිමියන් රචනා කළ යට දැක්වෙන ගීතය මගින් අවධාරණය කරන්නේ එබඳු මිත්‍රයන් පිළිබඳව ය.

**කළණ මිතුරු ගුණ විසිතුරු දකින්නේ නැතී**
**පවිටු මිතුරු ලොව සුමිතුරු දිනන්නේ නැතී**

**සුලඟ විලස ඇති නැති කළ**
**රැඳෙන්නේ නැතී**
**කළුළු විලස නිසි නිසි තැන**
**පිපෙන්නේ නැතී**
**යාළු කමට හිත හීතල**
**දැනෙන්නේ නැතී**

**සයුර විලස මල් හසරැලි**
**නගන්නේ නැතී**
**වෙරළ විලස දුක් ගින්දර**
**දරන්නේ නැතී**
**යාළු කුමට බෝසත් ගුණ**
**දරන්නේ නැතී** [25]

සංගීත නිර්මාණය - එඩ්වඩ් ජයකොඩි
ගායනය - එඩ්වඩ් ජයකොඩි, චරිතා ප්‍රියදර්ශනී පීරිස්

කළණ මිතුරු දුක සැප දෙකෙහි එක සේ රැඳෙයි. පවිටු මිතුරු සුලඟ සේ ය. ඇති නැති කළ රැඳෙන්නේ නැත. දුර්ජන මිත්‍රයා සර්පයන්ට වඩා භයානකය. සර්පයා දෂ්ට කරන්නේ එක්තරා අවස්ථාවක දී පමණයි. දුර්ජනයා එසේ නොවේ. ඔහු සෑම විට ම අයහපත ම කරයි.

**සර්පො දසති කාලේන දුර්ජනස්තු පදේ පදේ** යනුවෙන් සංස්කෘත පඬිවරු කියා ඇත. මෙසේ වූ දුර්ජන සමාජයෙන් මිදී වෙන් ව හුදකලාව සිටීම යහපතකි. සැපයකි.

බල්ලෝ මරා හෝ මිළ මුදල් රැස් කිරීමේ කලාව වර්තමාන මිනිස් සිත දූෂ්‍ය කරනු ලබයි. මනුස්සකම යටපත් වී රිදී කාසි පෙරට ආ සමයක සිද්ධාර්ථ හිමි මිනිසාට මනුස්සකමේ අගය කියා දෙයි.

**කාසි වලට ගන්නත් බෑ**
**කාසි වලට දෙන්නත් බෑ**
**මනුස්සකම මිනිස්සුනේ**
**කාසි වාසි ඇති අය ළඟ**
**බොහොම හිඟයි ගන්නට නෑ**
**මනුස්සකම මිනිස්සුනේ**

**දිඹුල් ගහක් ළඟට ගිහින්**
**අඬන්නෙපා මල් ඉල්ලා**
**මරු කතරක් මැදට ගිහින්**
**අඬන්නෙපා දිය ඉල්ලා**

**දිය දෝතක් බොන්න ඕන**
**දිය දෝතක් පිරුණු අතින්**
**මල් අහුරක් ගන්න ඕන**
**මල් අහුරක් පිරුණු අතින්** [26]

සංගීතය - වික්ටර් රත්නායක
ගායනය - වික්ටර් රත්නායක





කාසි වාසි ඇති ධනපතියන් ලඟ බොහෝම හිඟ වුව ද මනුස්සකම අත්‍යවශ්‍ය දෙයකි. එය ජීවිතවලට එකතු කරගත යුතු ය. මිනිසා තුළ මිනිස්කම නොමැති නම් ඔහු හුදු තිරිසනෙකු බවට පත්වෙයි. මිනිස්කම වර්තමාන සමාජයට අත්‍යවශ්‍ය දෙයක් බවට පත් වී ඇත. යුද බිය නිසා ද නැති වන්නේ මිනිස්කමයි. අතිශය ලෙස ධනයට ලොල්වීම නිසා ද මිනිසාගෙන් පලා යන්නෙ මිනිස්කම ය. එනිසා ම දිඹුල්ගහක් යටට ගිහින් මල් නො ඉල්ලන ලෙසත්, මරු කතරක් මැද දිය නො පතන ලෙසත් අවවාද කොට මනුස්සකමේ දිය දෝතකින් ද එබඳු ම වූ මල් අහුරකින් ද මනස පුරවා ගන්නට ශ්‍රාවකයාට ද ආරාධනා කරයි.

නමින් කපුරුහාමි වුව ද ලගින් යා නො හැකි තරමට කට ගඳ ගසයි. යන ජනවහර අසිරිමත් ගීතයකට නගන රචකයා එමගින් සමස්ත සමාජ විචාරයක යෙදෙයි. සමාජය තුළ කටින් සුදනන් වන ක්‍රියාවෙන් කිසිත් නැති එබඳු පුද්ගලයන් බොහෝ ය. බොරු පුරසාරම් , පිට ඔපය වැනි එබඳු කපටි මිනිසුන් දෙස සදය උපහාසයෙන් බලයි.

**නමින් කපුරුහාමිලා**
**හැංගි හැංගි වතුර නානවා**
**වතුරෙත් නෑ කපුරු සුවඳ**
**ළඟවත් නෑ කපුරු සුවඳ**
**නමට පමණි කපුරු සුවඳ**
**කපටි උන්දලා**

**කටින් බතල හිටවලා - හොරෙන් බතල උගුලලා**
**අතින් අරන් කටින් කන්න යෝධයෝ අපි**
**උපන් රටට වේද වැඩක් මෙහෙම නම් අපි**

**කකුළුවාගේ වැදි බණේ - පුරුදු වෙලා අපි අනේ**
**කරන කරන සෑම දේටම වුණේ ඒ විනේ**
**ඒ වැදි බණ අහන්නෙපා අනේ මිනිසුනේ** [27]

සංගීතය - වික්ටර් රත්නායක
ගායනය - වික්ටර් රත්නායක

06 OCT 2005

නමින් කපුරුහාමිලාට කටින් බතල කොළ සිටුවීම, කකුළුවාගේ වැදි බණ වැනි ජන විඥ්ඥාණයේ එන කියුම් රසවත් ව ගීතයේ තිසි තිසි තැන යොදමින් අමතු ම රස වින්දනාත්මක අවබෝධයක් සරල ව ලබාදීමට ගනු ලැබූ උත්සාහය ප්‍රසන්සනීය ය. නිබඳ ජනවහරට සමීප වන සිද්ධාර්ථ හිමියන්ගේ ගීත නිර්මාණ රීතිය ජනවහර පුරවහර කටවහර සහ සෙව් වහර අතර දෝලනය වුන බස්වහරකින් සමන්විත ය. යති රීතියෙහි මනාව පිහිටි යතිවරයෙකුගේ කාර්යය මෙන් ම පුරාණ සම්භාව්‍ය ග්‍රන්ථවල නො මද ඇසුර ද ලබමින් සාමාන්‍ය ජනතාව වෙත මහෝපදේශ තිළිණ කර ඇත. ඒ සඳහා උන්වහන්සේ විදග්ධ , රසික බස හමුවට නොයයි. සාමාන්‍ය ජනතාව දන්නා හඳුනන උපමා රූපක සරල ව භාවිත කර ගනී. විටෙක ජන කවියාගේ ද ආභාසය ලබයි. මහෝපදේශ සරල ව ජනතාව වෙත ඉදිරිපත් කරමියි දඹදෙණි යුගයේ ධර්මසේන හිමියන්ගේ ඇරඹි අවිච්ඡින්න යති උරුමය රඹුකන හිමියන්ගේ ගී ආර තුළ සාර විළිකුන් එල සේ දක්නට ලැබේ.





**පාදක සටහන්**

1. අං. නි. චතුක්ක නිපාත, කවි සූත්‍රය
2. සං. නි. කවි සූත්‍රය
3. වත්තේවැවේ ධම්මානන්ද හිමි. **'වී පතක් සොයා'** රත්න ශ්‍රී ලිපිය - වන්නි ප්‍රකාශන - 2000
4. පල්ලේගම හේමරතන හිමි **'පහනනිවී දොළොස් මහේ'** වසන්න පොත් 1988 - පිට 01
5. රඹුකන සිද්ධාර්ථ හිමි - **'සංසාරේ අපි'** - පිට 02 - බෞද්ධ භාවනා මධ්‍යස්ථානය - සිංගප්පූරුව 1986
6. ගුත්තිල කාව්‍යය - වෑත්තෑවේ හිමි.
7. රඹුකන සිද්ධාර්ථ හිමි - **'සංසාරේ අපි'** - පිට 20 - බෞද්ධ භාවනා මධ්‍යස්ථානය - සිංගප්පූරුව 1986
8. ගුත්තිල කාව්‍යය - වෑත්තෑවේ හිමි.
9. රඹුකන සිද්ධාර්ථ හිමි - **'සඳතරු මල්'** - පිට 15 - සුරස පොත් - 2004
10. බුදුගුණ අලංකාරය - 86 කවිය - කිරිඇල්ලේ ඤාණවිමල සංස්කරණය - 2004
11. රඹුකන සිද්ධාර්ථ හිමි - **'සඳතරු මල්'** - පිට 33 - සුරස පොත් - 2004
12. බුදුගුණ අලංකාරය - 86 කවිය - කිරිඇල්ලේ ඤාණවිමල සංස්කරණය - 2004
13. රඹුකන සිද්ධාර්ථ හිමි - **'සසර දනව්ව'** කැසට් පටය - සිංග් ලංකා සමාගම - 1989
14. ප්‍රත්‍ය සතකය - 5 වන ශ්ලෝකය - ගුණසේන සමාගම - 1988
15. සුභාෂිතය - අලගියවන්න මුකවෙටි - 45 කවිය - අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව - 1979
16. රඹුකන සිද්ධාර්ථ හිමි - **'සංසාරේ හැවී'** - කැසට් පටය 1992

17 ධම්මපදය - බාල වග්ගය - 10 ගාථාව

18. ලෝවැඩ සඟරාව - වීදාගම මෛත්‍රිය හිමි

19. ධම්මපදය - බාල වග්ගය - 10 ගාථාව

20. රඹුකන සිද්ධාර්ථ හිමි - **'සංසාරේ ගී යාතිකා'** කැසට් පටය - සිංග් ලංකා සමාගම - 1990

21. මංගල සූත්‍රය

22. සුභාෂිතය - අලගියවන්න මුකවෙටි - 39 කවිය - අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව - 1979

23. ගුත්තිල කාව්‍යය - වැත්තෑවේ හිමි

24. පංච තන්ත්‍රය - විශ්ණු ශර්මන්

25. රඹුකන සිද්ධාර්ථ හිමි - **'සඳතරු මල්'** - පිට 23 - සුරස පොත් - 2004

26. රඹුකන සිද්ධාර්ථ හිමි - **'සඳතරු මල්'** - පිට 29 - සුරස පොත් - 2004

27. රඹුකන සිද්ධාර්ථ හිමි - **'ගම්මානේ අපි'** කැසට් පටය - සිංග් ලංකා සමාගම - 1998